# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## *ශිෂ්‍ය නේවාසිකාගාරවල නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් පිළිපැදිය යුතු නීති රීති*

නේවාසිකාගාරවල සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් පහත සඳහන් නීති රීති තරයේ පිළිපැදිය යුතු ය. මෙම නීති රීති උල්ලංඝනය කිරීම වරදක් බැවින් ඒ සම්බන්ධයෙන් වැරදි කරුවන් වන අය දඬුවමකට සහ විනයානුකූල ව කටයුතු කිරීමකට යටත් වන්නේ ය.

### පොදු නීති රීති

01. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නේවාසිකාගාර පහසුකම් සපයනු ලබන්නේ අධ්‍යයන කටයුතු සඳහා පමණි. නිවාඩු කාලය ආරම්භ වී දින දෙකක් ඇතුළත සියළුම නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන් නේවාසිකාගාර හැර යා යුතු අතර ඊළඟ අධ්‍යයන වාරය ආරම්භවීමට පෙර දින පස්වරු 5.00 ට පෙර අදාළ නේවාසිකාගාරයට පැමිණිය යුතුය. නිවාඩු කාලයේ දී අධ්‍යයන කටයුත්තක් සඳහා අදාළ අංශ ප්‍රධානිගෙන් ලිඛිත අවසරයක් ලබා ගත යුතු ය. නිවාඩු කාලය තුළ නේවාසිකාගාරවල රැඳී සිටීමට හෝ නේවාසිකාගාරවල තම තමන්ගේ බඩුබාහිරාදිය (වටිනා බඩුබාහිරාදිය සහ වැදගත් ලිය කියවිලි හැර) තබා යාමට අවශ්‍ය නම් ඒ සඳහා ලිඛිත අවසරයක් ලබා ගත යුතු ය.

02. කිසියම් හේතුවක් මත නේවාසිකාගාර පහසුකම් ලබා ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඉන් ඉවත් වී බාහිර ස්ථානයක නේවාසික වන්නේ නම් ඒ බව නේවාසිකාගාරයෙන් ඉවත්වීමට පෙර නේවාසිකගාර ශාලාධිපතිවරුන්ට හා ශිෂ්‍ය සේවා අංශයට ලිඛිතව දැනුම් දිය යුතු ය. එසේ ලිඛිතව දැනුම් නොදෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන් කිසිදු හේතුවක් නිසා නේවාසිකාගාර ගාස්තුවලින් නිදහස් නොකරනු ඇත.

03. විශ්වවිද්‍යාලය වසා දමන අවස්ථාවල දී සියළු ම ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුම් දෙනු ලබන වේලාවට පෙර නේවාසිකාගාරවල යතුරු ආපසු භාර දී වහාම නේවාසිකාගාරවලින් පිට විය යුතු ය.

04. නේවාසිකාගාර පහසුකම් ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හැර වෙනත් කිසිම අයෙකුට උපශාලාධිපතිගේ අවසරයක් නොමැතිව නේවාසිකාගාරවලට ඇතුල් වීම හෝ නවාතැන් ගැනීම තහනම් ය. අවසර නොමැතිව නේවාසිකාගාරවල රැඳී සිටින්නන්ට හා ඒ සඳහා උදව් කරන නේවාසිකාගාර පහසුකම් ලැබූ අයට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කරනු ඇත.

05. නේවාසිකයින් සියළු දෙනාම තමන්ගේ විශ්වවිද්‍යාල හැඳුනුම්පත ළඟ තබා ගතයුතු අතර අවශ්‍ය විට ඉදිරිපත් කළ යුතු ය.

06 සියළුම ශිෂ්‍යාවන් රාත්‍රි 8.00ට පෙර ද ශිෂ්‍යයින් රාත්‍රි 10.00ට පෙර ද නේවාසිකාගාර වෙත පැමිණිය යුතු ය. සියළුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් නේවාසිකාගාරවලින් පිටවීම උදේ 4.30න් පසුව සිදුකළ යුතුය. විශ්වවිද්‍යාලයේ අවසරලත් අධ්‍යයන සහ ශිෂ්‍ය කටයුතු සඳහා ප්‍රමාදවන හා උදේ 4.30ට පෙර පිටවීමේ දී මුද්‍රණය කර ඇති අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කර අවසර ලබා තිබීම අනිවාර්ය වන අතර සටහන් ලේඛණයේ පැමිණීම පිටවීම ලේඛන සටහන් කිරීම අනිවාර්ය වේ.

(තමන් නේවාසිකව සිටින නේවාසිකාගාරය හැර වෙනත් නේවාසිකාගාර වෙත යාමේ දී බාහිරින් පැමිණෙන ලේඛනයේ සටහන් කිරීම අත්‍යවශ්‍ය වේ.)

07. කිසිම ශිෂ්‍යයෙකුට ශිෂ්‍ය නේවාසිකාගාරය තුළට කවර අන්දමේ හෝ මත්පැන් හෝ මත් ද්‍රව්‍ය රැගෙන ඒම නේවාසිකාගාරය තුළ පානය කිරීම හෝ පානය කර පැමිණීම සම්පූර්ණයෙන් ම තහනම් ය. නේවාසිකාගාර පරිශ්‍රය තුළ බීමත්ව හා අශෝභන ලෙස හැසිරි යම් ශිෂ්‍යයෙක් හෝ ශිෂ්‍ය කණ්ඩායමක් අසුවුහොත් දැඩි විනය ක්‍රියා මාර්ග ගැනීමට සිදුවන බව දන්වමි.

08. නව අධ්‍යයන වර්ෂයක් වෙනුවෙන් නේවාසිකාගාර සඳහා ලියාපදිංචි වන විට එකී වර්ෂය සඳහා වූ නේවාසිකාගාර ගාස්තු ගෙවා ලබා ගත් රිසිට් පත ශිෂ්‍ය සේවා අංශයට හෝ ඉදිරිපත් කර ශිෂ්‍ය වාර්තා පොතේ මුද්‍රා සටහන් තබා අදාළ නේවාසිකාගාර උපශාලාධිපති වෙත ඉදිරිපත් කර අත්සන ලබා ගත යුතු ය. පෙර අධ්‍යයන වර්ෂය අවසානයේ හෝ නව අධ්‍යනය වර්ෂය ආරම්භවීමට පෙර ගාස්තු ගෙවීම අනිවාර්යෙන් ම කළ යුතුය. නිසි පරිදි නේවාසිකාගාර ගාස්තු නොගෙවීම නේවාසික පහසුකම් නොලැබීමට හේතු වනු ඇත.

### *උපකරණ භාවිතය*

09. නේවාසිකයින් ඔවුන්ගේ කාමර භාර ගන්නා විට ඒවායේ ඇති සියළුම උපකරණ සඳහන් කළ ලේඛණයට අත්සන් කර ඒවා භාර ගත යුතු ය. ඔවුන් එසේ භාර ගත් උපකරණ සඳහා වගකිව යුතු ය. මේවා භාර ගන්නා විට යම් කිසි අලාභයක් සිදු වී ඇති බව පෙනී ගියහොත් ඒවා නිසියාකාරව ඒ අවස්ථාවේදී ම අදාළ ලේඛණයේ සටහන් කළ යුතු ය. (යතුරු භාර ගන්නා අවස්ථාවේදී උපශාලාධිපති ඒ ඒ උපකරණ හොඳ තත්ත්වයෙන් ඇත් දැයි පරීක්ෂා කර බලනවා ඇත)

10. නේවාසිකයින් කාමරවල ඇති, විශ්වවිද්‍යාලයට අයිති කිසිම උපකරණයක් පිටතට ගෙන යාම හෝ නේවාසිකාගාරයට අයත් නොවන උපකරණ නේවාසිකාගාරවලට ගෙන ඒම නො කළ යුතු ය. එසේ ගෙන ඒමට අවශ්‍ය උපකරණ වේ නම් උපශාලාධිපති ගෙන් ලිඛිත අවසරයක් ලබා ගත යුතු ය.

11. නේවාසිකයින් නේවාසිකාගාරවල ඇති ලී බඩු ජනේල බිත්ති සහ විශ්වවිද්‍යාලයට අයත් කිසිම උපකරණයකට අලාභහානි කිරීම හෝ ඒවා විරූපී කිරීම නො කළ යුතු ය. එසේ කරන්නන්ගෙන් අලාභය අය කර ගනු ලැබේ. වැරදි කරුවන් සොයා ගැනීමට නොහැකි වුවහොත් නේවාසිකයින් සියළු දෙනාගෙන් ම එම අලාභය අය කර ගනු ලැබේ.

12. නේවාසිකයන් යම් උපකරණයක් සොරකම් කරනු ලැබුවහොත් ඒ සම්බන්ධව දැඩිව ක්‍රියා කරනු ඇත. නේවාසිකයින් නේවාසිකාගාරවල ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක නිලධාරින් සමග සහයෝගයෙන් ක්‍රියා කළ යුතු අතර විශේෂයෙන් ම උපශාලාධිපතින්ගේ අවසරයක් නොමැතිව පිටස්තර අය පැමිණීම වැළැක්වීමට ක්‍රියා කළ යුතු ය.

13. නේවාසිකයින් සෑම විටම ඇඳ ඇතිරිලි භාවිතා කිරීමෙන් මෙට්ට ආරක්ෂා කළ යුතු ය. සෑම නේවාසිකයෙක් ම ඇඳ ඇතිරිල්ලක් සහ කොට්ටයක් තමා විසින් සපයා ගත යුතු ය.

14. විශ්වවිද්‍යාලය විසින් සපයා ඇති උපකරණ හැර වෙනත් කිසිම විදුලි උපකරණයක් නේවාසිකාගාරවල භාවිතා කිරීම තහනම්ය. විදුලි උපකරණ, ස්විච් හා විදුලි රැහැන් තමන්ට අවශ්‍ය පරිදි සකස් කිරීම අන්තරාදායක විය හැකිය. එවැනි ක්‍රියාවලින් නේවාසිකයින් වැළකී සිටිය යුතුය. එවැනි තත්ත්වයන් යටතේ සිදු වන අනතුරු පිළිබඳ විශ්වවිද්‍යාලය වග කියනු නො ලැබේ.

<u>***සමාජීය වගකීම්***</u>

15. නේවාසිකයින් අනෙකුත් නේවාසිකයන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගෙන ඔවුනට හිරිහැර නොවන ආකාරයට හැසිරිය යුතු ය.

16. නේවාසිකයින් අසල්වැසියන්ට කරදර නොවන ලෙස හැසිරිය යුතු ය. විශේෂයෙන් රාත්‍රී 10.00 න් පසු නිශ්ශබ්දතාවය රැකිය යුතු ය.

17. නේවාසිකයින් තමන්ගේ කාමර පිරිසිදුව හා පිළිවෙලට තබා ගත යුතු ය. සිය ඇඳුම් පැළඳුම් තැන් තැන් වල දමා නො තිබිය යුතු ය. නේවාසිකාගාරවළ දී සහ ඉන් පිටතට පැමිණෙන විට දී නිසියාකාරව හැඳපැළඳ සිටිය යුතු ය. ජනෙල් කවුළු වල දොර ජනෙල් සඳළු තල හෝ නේවාසිකාගාර ඉදිරිපිට පිටතට ප්‍රදර්ශනය වන අයුරින් ඇඳුම් පැළඳුම් දැමීම නො කළ යුතු ය.

18. වැසිකිළි සහ නාන කාමර පිරිසිදුව තබා ගත යුතු ය. නඩත්තු හා සනීපාරක්ෂක කටයුතු පිළිබඳව උපශාලාධිපතිට දැනුම් දිය යුතු ය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / අධ්‍යයන හා ශිෂ්‍ය සේවා
ලේඛකාධිකාරී වෙනුවට
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

(මෙම උපදෙස් මාලාව පාලක සභාවේ තීරණය අනුව වරින්වර සංශෝධනයන්ට ලක්ව ඇත.)

---

මුලකුරු සමග නම : ......................................................................................

ශිෂ්‍ය ලියාපදිංචි අංකය : ...............................................................................

නේවාසිකාගාරයේ නම : ..................................................................................

පාඨමාලාව : ...................................................................................................

ඉහත නම සඳහන් මා විසින් මෙම නේවාසිකාගර නීතිරීති මාලාව කියවා තේරුම් ගන්නා ලද බව සහතික කරමි.

දිනය - ........................ ......................................
ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ අත්සන